# කාර්ය සාධන වාර්තාව

# செயலாற்று அறிக்கை

# Performance Report

## 2014

සමුපකාර සංවර්ධන දෙපාර්තමේන්තුව - ශ්‍රී ලංකාව
கூட்டுறவு அபிவிருத்தித் திணைக்களம்
Department of Co-operative Development - Sri Lanka

**දැක්ම**

ජනතා ව්‍යවසායක් ලෙස තිරසාර

සංවර්ධනයට සමුපකාරය

**මෙහෙවර**

ශ්‍රී ලංකාවේ සමුපකාර ව්‍යාපාරය

ජනතා ව්‍යවසායක් ලෙස සංවර්ධනය කිරීම සඳහා

සානුබල සපයමින්,

සමුපකාර සමිතිවල යහ පාලනය

ගොඩනැගීම සඳහා

පුළුල් ලෙස මැදිහත් වීම.

# පෙරවදන

"ජනතා ව්‍යාවසායක් ලෙස තිරසාර සංවර්ධනයට සමුපකාරය" යන්න දැක්ම කර ගනිමින් සමුපකාර ආයතනවල යහපාලනය ගොඩනැගීම සඳහා පුළුල් ලෙස මැදිහත් වීම මෙහෙවර කර ගත් මධ්‍යම රජයේ සමුපකාර සංවර්ධන දෙපාර්තමේන්තුව 2014 වසර වෙනුවෙන් සැකසූ කාර්ය සාධන වාර්තාව ඔබ අතට පත් කරනු ලබන්නේ ඉමහත් සතුටිනි.

සමුපකාර සංවර්ධන දෙපාර්තමේන්තුවේ ව්‍යුහය හා කාර්ය භාරය පිළිබඳවත් අභ්‍යන්තර පරිපාලනය, මානව සම්බන්ධතා සංවර්ධනය සහ විගණන කටයුතු, නීති කටයුතු පිළිබඳවත්, අධීක්ෂණයට භාජනය වන සමුපකාර සංගම් හා සමිති පිළිබඳවත් සංෂිප්ත විස්තර පරිච්ඡේද 3ක් මගින් මෙම වාර්තාවේ ඉදිරිපත් කර ඇත. විශේෂයෙන් සමුපකාර ව්‍යාපාරය තුළ එහි නියමු කාර්යභාරයක් ලෙස දෙපාර්තමේන්තුවේ සෘජු මැදිහත්වීම පිළිබඳව අධ්‍යයන කටයුතු වල නිරතවන්නන්ට මෙම වාර්තාව පරිශීලනය කිරීම මගින් පහසුවෙන් තොරතුරු අවබෝධ කරගත හැකිය.

සමුපකාර විෂය විමධ්‍යගත කිරීමත් සමග පළාත් මට්ටමේ සමුපකාර සංවිධාන, පළාත් දෙපාර්තමේන්තු මගින් පාලනය වන බැවින්, මධ්‍ය රජයේ පාලනය යටතට ගැනෙන සමුපකාර සමිතිවල තොරතුරු පමණක් මෙහි ඇතුළත් කර ඇත.

ශ්‍රී ලංකාවේ සමුපකාර ව්‍යාපාරය තුළින් මෙරට ආර්ථික, සාමාජීය, සුභ සාධනය යන සියලු අංශයන්හි උන්නතිය උදෙසා රාජ්‍ය අංශයේ දායකත්වය ලබා දීමට සමුපකාර සංවර්ධන දෙපාර්තමේන්තුවට හැකි වී ඇති බව මාගේ විශ්වාසයයි.

ධම්මික රාජපක්ෂ
සමුපකාර සංවර්ධන කොමසාරිස්/ රෙජිස්ට්‍රාර්

# පටුන


1. සමුපකාර සංවර්ධන දෙපාර්තමේන්තුවේ කාර්යයභාරය හා ව්‍යුහය
    - 1.1 සමුපකාර සංවර්ධන දෙපාර්තමේන්තුවේ කාර්යයන්
    - 1.2 සමුපකාර සංවර්ධන දෙපාර්තමේන්තුවේ ව්‍යුහය
    - 1.3 සමුපකාර සංවර්ධන දෙපාර්තමේන්තුවේ පොදු පරිපාලනය
        - 1.3.1 කාර්ය මණ්ඩල සංඛ්‍යා හා පුරප්පාඩු
        - 1.3.2 නව පත්වීම් ලබා පැමිණි නිලධාරීන්
        - 1.3.3 ස්ථාන මාරු ලබා පැමිණි නිලධාරීන්
        - 1.3.4 කාර්ය මණ්ඩල විශ්‍රාම ගැන්වීම්
        - 1.3.5 ස්ථාන මාරු වී ගිය නිලධාරීන්
    - 1.4 කාර්ය මණ්ඩල පුහුණු කිරීම් සහ සංවර්ධනය
        - 1.4.1 දේශීය පුහුණු
        - 1.4.2 විදේශීය පුහුණු
        - 1.4.3 මහජන බැංකු ආධාර යටතේ සිදු කරනු ලබන පුහුණු වැඩසටහන්
    - 1.5 රජයේ විගණනය

2. සමුපකාර සංවර්ධන දෙපාර්තමේන්තුවේ සංවර්ධන ක්‍රියාකාරකම්
    - 2.1 2014 වර්ෂයේ ලියාපදිංචි කරන ලද සමුපකාර සමිති
    - 2.2 සමුපකාර සමිතිවල අතුරු ව්‍යාවස්ථා සංශෝධනය කිරීම
    - 2.3 සමුපකාර සමිති/සංගම් නිලවරණ පැවැත්වීම්
    - 2.4 සමුපකාර සමිතිවල ව්‍යවස්ථාපිත විගණන කටයුතු
    - 2.5 සමුපකාර සංවර්ධන දෙපාර්තමේන්තුවේ නීති කටයුතු
        - 2.5.1. ආරවුල් බේරුම් කරණය
        - 2.5.2 උසාවි බලගැන්වීම්
        - 2.5.3. වර්ෂය තුළ අවසන් වූ නඩු
        - 2.5.4. සමුපකාර සමිති / සංගම් පිළිබඳ පරීක්ෂණ
    - 2.6 අරමුදල් කළමනාකරණය
        - 2.6.1 සමුපකාර අරමුදල
        - 2.6.2 සමුපකාර අතිරික්ත අරමුදල
    - 2.7 2014 වර්ෂය සඳහා රජයේ අයවැය මගින් වෙන් කළ මූල්‍ය ප්‍රතිපාදන හා වියදම් දැරීම
    - 2.8 ග්‍රාමීය බැංකු නියාමනය
    - 2.9 ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම
    - 2.10 සැලසුම් කටයුතු
    - 2.11 මාධ්‍ය කටයුතු

3. ජාතික මට්ටමේ සමුපකාර සංවිධාන
    - 3.1. වර්ෂය තුළ ක්‍රියාත්මක වූ සමුපකාර සංගම්
    - 3.2. වර්ෂය තුළ ක්‍රියාත්මක වූ සමුපකාර සමිති
        - 3.2.1. දීප ව්‍යාප්ත මූල්‍ය සේවා සමුපකාර සමිති
        - 3.2.2. දීප ව්‍යාප්ත නිෂ්පාදන සේවා සමුපකාර සමිති

# පරිච්ඡේදය 01

## සමුපකාර සංවර්ධන දෙපාර්තමේන්තුව

2014 වර්ෂයේ අග භාගය වන තෙක් සමුපකාර හා අභ්‍යන්තර වෙළඳ අමාත්‍යාංශය යටතේ ක්‍රියාත්මක වෙමින් අංක 330, යූනියන් පෙදෙස, කොළඹ 02 දරන ස්ථානයෙහි පිහිටා ඇති සමුපකාර සංවර්ධන දෙපාර්තමේන්තුව 1930 ඔක්තෝම්බර් මස 01 වන දින සමුපකාර දෙපාර්තමේන්තුව නමින් ආරම්භ වී ඇති අතර, 1945 වසරේ දී සමුපකාර සංවර්ධන දෙපාර්තමේන්තුව නමින් ස්ථාපිත වී ඇත. තිරසාර සංවර්ධනයකට මග පෙන්වමින් සමුපකාර සමිති වල යහපාලනය උදෙසා පුළුල් මෙහෙවරක් ඉටු කිරීමට සමුපකාර සංවර්ධන දෙපාර්තමේන්තුව සමත් වී ඇත.

### 01. 1 දෙපාර්තමේන්තුවේ කාර්යයන්

- ❖ අන්තර් පළාත් හා සමස්ත ලංකා මට්ටමේ සමුපකාර සමිති, සංගම් ලියාපදිංචි කිරීම.
- ❖ ලියාපදිංචි සමුපකාර සමිති හා සංගම් වල ව්‍යවස්ථාපිත කටයුතු මෙහෙයවීම සහ සංවර්ධනයට අදාල කටයුතු සිදු කිරීම.
- ❖ පළාත් සමුපකාර සංවර්ධන දෙපාර්තමේන්තු හා සම්බන්ධීකරණය වෙමින් ජාතික ප්‍රතිපත්තියක් තුළ සමුපකාර ව්‍යාපාරයේ කටයුතු මෙහෙයවීම.
- ❖ ජාතික සමුපකාර සංවර්ධන ක්‍රියාදාමයන්ට සහාය වීම.
- ❖ රාජ්‍ය ප්‍රතිපත්ති ක්‍රියාත්මක කිරීම සඳහා සංවර්ධනාත්මක දායකත්වයක් සැපයීම.

### ව්‍යවස්ථාපිත කටයුතු

- ❖ සමිති ලියාපදිංචි කිරීම
- ❖ සමිති ඒකාබද්ධ හා විබද්ධ කිරීම
- ❖ සාමාජිකත්වය පිළිබඳ කටයුතු
- ❖ අතුරු ව්‍යවස්ථා හා සංශෝධනයන් අනුමත කිරීම
- ❖ නිළවරණ කටයුතු
- ❖ මහා සභා කැඳවීම/ කාරක සභා කැඳවීම හා වලංගුභාවය තීරණය කිරීම
- ❖ ලියාපදිංචි සමුපකාර සමිති විසුරුවා හැරීම
- ❖ තීරකකරණ කටයුතු සහ උසාවි බලගැන්වීම්
- ❖ සමුපකාර සමිති/ සංගම් වල වාර්ෂික විගණනයන් සිදු කිරීම

## කළමනාකරණයට අදාළ කටයුතු

- ❖ පාලක මණ්ඩල පත් කිරීම/ අධ්‍යක්ෂ මණ්ඩල සාමාජිකයින් පත්කිරීම
- ❖ ගිණුම් කටයුතු අධීක්ෂණය
- ❖ විගණනය
- ❖ පනතේ විධිවිධාන පරිදි සාමාන්‍ය/විශේෂ විභාග හා පරීක්ෂණ පැවැත්වීම
- ❖ කළමනාකරණ අධ්‍යාපනය සහ උපදෙස් දීම

## සම්බන්ධීකරණ කටයුතු

- ❖ සමුපකාර හා අභ්‍යන්තර වෙළඳ අමාත්‍යාංශය හා වෙනත් රාජ්‍ය ආයතන සමග සම්බන්ධීකරණය.
- ❖ පළාත් සමුපකාර අමාත්‍යවරුන්, අමාත්‍යාංශ ලේකම්වරුන් හා පළාත් සමුපකාර සංවර්ධන කොමසාරිස් සහ සමුපකාර සමිති රෙජිස්ට්‍රාර්වරුන් සමඟ සම්බන්ධීකරණය සඳහා සමුපකාර හා අභ්‍යන්තර වෙළෙඳ අමාත්‍යාංශයට සහය වීම.
- ❖ ජාත්‍යන්තර සමුපකාර සන්ධානය සහ විදේශීය සමුපකාර ආයතන සම්බන්ධීකරණය
- ❖ සමුපකාර ග්‍රාමීය බැංකු හා සමුපකාර මූල්‍ය ආයතන පිළිබඳව ශ්‍රී ලංකා මහ බැංකුව සමඟ සම්බන්ධීකරණය
- ❖ සමුපකාර සමිති වලට අදාල සංඛ්‍යා ලේඛන පිළිබඳව මහ බැංකුව හා ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව සමඟ සම්බන්ධීකරණය
- ❖ වී මිලදී ගැනීම, සහන මිලට පොහොර බෙදාහැරීම වැනි කටයුතු වලදී සමුපකාර සමිති, කෘෂිකර්ම විෂය භාර අමාත්‍යාංශය සමග සම්බන්ධීකරණය කිරීම
- ❖ සමුපකාර සමිති/ සංගම් අතර සම්බන්ධීකරණය

## සංවර්ධන කටයුතු

- ❖ වාර්ෂික අයවැය ප්‍රතිපාදන අනුව ජාතික මට්ටමේ සහ පළාත් මට්ටමේ සංවර්ධන කාර්යයන් ඉටුකිරීම.
- ❖ සමුපකාර සමිති වල යහ පාලනය සහතික කිරීමට අදාල කටයුතු ඉටු කිරීම.
- ❖ සමුපකාර සමිති හා සංගම්වල සංවර්ධනය සඳහා සංවර්ධන උපදේශන සේවා සැපයීම.
- ❖ සමුපකාර සමිති හා සංගම්වල මූල්‍ය හා මෙහෙයුම් ක්‍රියාකාරකම් අධීක්ෂණය.
- ❖ සංවර්ධන ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම.
- ❖ සංවර්ධන ආධාර හා සානුබල සැපයීම.
- ❖ සංවර්ධන මාර්ගෝපදේශ සැපයීම හා සම්බන්ධීකරණය.
- ❖ සමුපකාර ක්ෂේත්‍රයේ සහ දෙපාර්තමේන්තුවේ මානව සම්පත් සංවර්ධනය.
- ❖ සේවක / නිලධාරි සුභ සාධනය.

## අරමුදල් පාලනය

- ❖ දෙපාර්තමේන්තුවේ ස්ථාපිතව ඇති සමුපකාර අරමුදල සහ අතිරික්ත අරමුදල කළමනාකරණය.
- ❖ ව්‍යවස්ථාපිත සමිති වල වාර්ෂික විගණනයෙන් පසු වෙන්කරනු ලබන දායක මුදල් අයකර ගැනීම.
- ❖ සමුපකාර සමිතිවල සංවර්ධන ව්‍යාපෘති හා පුහුණු කටයුතු සඳහා ණය සහ ආධාර ලබා දීම හා ණය අයකර ගැනීම.
- ❖ ඵලදායි ලෙස අරමුදල් ආයෝජනය කිරීම.

## අභ්‍යන්තර පරිපාලන හා කළමනාකරණ කටයුතු


- ❖ සාමාන්‍ය පරිපාලනය.
- ❖ මානව සම්පත් කළමනාකරණය.
- ❖ කාර්ය සාධනය වර්ධනය.
- ❖ වත්කම් කළමනාකරණය.

## 01. 2 දෙපාර්තමේන්තුවේ ව්‍යුහය

2014 වර්ෂය තුළ දෙපාර්තමේන්තුවේ කාර්යභාරය අංශ 09 ක් ලෙස සංවිධානය වී ක්‍රියාත්මක වී ඇත. එනම්,

1. පරිපාලන අංශය
2. මුදල් අංශය
3. සංවර්ධන අංශය
4. විගණන අංශය
5. නීති අංශය
6. අරමුදල් අංශය
7. බැංකු නියාමන අංශය
8. ව්‍යාපෘති අංශය
9. සැලසුම් අංශය

# සමුපකාර සංවර්ධන දෙපාර්තමේන්තුවේ සංවිධාන ව්‍යුහය



## 01.3 දෙපාර්තමේන්තුවේ පොදු පරිපාලනය

අප දෙපාර්තමේන්තුවෙහි පරිපාලන ව්‍යුහයෙහි මෙම වසර තුළ සිදු වූ සුවිශේෂී වූ සිදුවීම් කිහිපයකි.

වසර 83 ක ඉතිහාසයකට හිමිකම් කියන සමුපකාර සංවර්ධන දෙපාර්තමේන්තුවට ප්‍රථම වරට නිල ලාංඡනයක් හඳුන්වාදීම සහ දෙපාර්තමේන්තු වෙබ් අඩවිය නව මුහුණුවරකින් එළිදැක්වීමට හැකිවීම මෙම වසරේ සිදුවූ විශේෂ සිදුවීමක් ලෙසට සඳහන් කළ හැකිය.

සමුපකාර සංවර්ධන කොමසාරිස්/රෙජිස්ට්‍රාර් තනතුරෙහි සේවය කල ශ්‍රී ලංකා පරිපාලන සේවයෙහි විශේෂ ශ්‍රේණියේ ඩබ්ලිව්. එච්. කරුණාරත්න මහතා සමුපකාර හා අභ්‍යන්තර වෙළඳ අමාත්‍යාංශයේ අතිරේක ලේකම් (සමුපකාර) තනතුර සඳහා අනුයුක්ත කිරීම මත, 2014.07.02 දින සිට සමුපකාර සංවර්ධන කොමසාරිස්/රෙජිස්ට්‍රාර් තනතුර සඳහා ශ්‍රී ලංකා පරිපාලන සේවයෙහි I පන්තියේ ඩී. ඩී. උපුල් ශාන්ත ද අල්විස් මහතා පත්වීම මෙම වසර තුළ දී සිදුවිය.

පුරප්පාඩුව පැවති ගණකාධිකාරී තනතුරේ වැඩ බැලීමේ පදනමින් සේවය කල, අමාත්‍යාංශයේ ගණකාධිකාරී බී. කේ. එම්. ජේ. රොද්‍රිගු මහත්මිය 2014.03.05 වන දින සිට ස්ථිර පදනමින් දෙපාර්තමේන්තුවට අනුයුක්ත කිරීම ද මෙම වසර තුළ සිදුවිය.

එමෙන්ම දෙපාර්තමේන්තුගත සහකාර කොමසාරිස් (සංවර්ධන) තනතුරෙහි සේවයේ කල ජේ. එච්. සෙනරත් බණ්ඩාර මහතා විශ්‍රාම යාම මෙන්ම පරිපාලන නිලධාරි තනතුරෙහි සේවය කල එච්. ජී. වී. ආර්. සෝමවර්ධන මහත්මිය විශ්‍රාම යාමද මෙම වසරෙහි සිදු විය.

සමුපකාර සංවර්ධන සහකාර කොමසාරිස් (දෙපාර්තමේන්තුමය) තනතුරු පුරප්පාඩු වෙනුවෙන් නිලධාරීන් උසස් කිරීම සඳහා සම්මුඛ පරීක්ෂණ පැවැත්වීම ද මෙම වසර තුළ සිදු කරන ලද අතර, 2013 වසරේ සම්මුඛ පරීක්ෂණය පවත්වන ලද සමුපකාර සංවර්ධන දිස්ත්‍රික් නිලධාරී තනතුරු පුරප්පාඩු 05 ම එලෙසම පැවතීම දෙපාර්තමේන්තු අධීක්ෂණ කටයුතු සිදු කිරීමට ඉමහත් බාධාවක් විය.

රාජ්‍ය කළමනාකරණ සහකාර සේවයේ තනතුරු පුරප්පාඩු සඳහා නවක නිලධාරිනියන් 05 දෙනෙක් හා කාර්යාල කාර්ය සහායක සේවයේ තනතුරු පුරප්පාඩු සඳහා නවක සේවකයන් දෙදෙනෙක් දෙපාර්තමේන්තුව වෙත අනුයුක්ත වීම ද මෙම වසර තුළ සිදු විය.

2014 වසරේ දී පහත සඳහන් වාහන දෙපාර්තමේන්තුව සතුව තිබුණි.

| වාහන වර්ගය | වාහන අංකය |
|---|---|
| TOYOTA “HIACE” VAN | NB - 3531 |
| TOYOTA DOUBLE CAB | PE - 0201 |
| ISUZU DOUBLE CAB | GB - 4130 |
| ISUZU DOUBLE CAB | 253 - 5664 |
| NISHAN CAR | GB - 4739 |

## 01. 3.1 කාර්ය මණ්ඩල සංඛ්‍යාව හා පුරප්පාඩු

මෙම දෙපාර්තමේන්තුවේ අනුමත තනතුරු හා එම තනතුරුවල 2014-12-31 දිනට සේවය කළ සංඛ්‍යාව හා පුරප්පාඩු පහත පරිදි වේ.

| අනු අංශය | තනතුර | අනුමත වර්තමාන සේවක සංඛ්‍යාව | 2014-12-31 දිනට සේවයේ යෙදී සිටි සේවක සංඛ්‍යාව | පුරප්පාඩු සංඛ්‍යාව |
|---|---|---|---|---|
| ජ්‍යෙෂ්ඨ මට්ටම | සමුපකාර සංවර්ධන කොමසාරිස් සහ සමුපකාර සමිති රෙජිස්ට්‍රාර් (ශ්‍රී ලංකා පරිපාලන සේවය I) | 01 | 01 | - |
| | නියෝජ්‍ය කොමසාරිස්/සහකාර කොමසාරිස් (ශ්‍රී ලංකා පරිපාලන සේවය II, III) | 04 | 02 | 02 |
| | ගණකාධිකාරී (ශ්‍රී ලංකා ගණකාධිකාරී සේවය II, III) | 01 | 01 | 00 |
| | නියෝජ්‍ය කොමසාරිස්/සහකාර කොමසාරිස් (දෙපාර්තමේන්තුගත) | 03 | 02 | 01 |
| | **එකතුව** | **09** | **06** | **03** |
| තෘතිය මට්ටම | පරිපාලන නිලධාරී | 01 | 00 | 01 |
| | සමුපකාර සංවර්ධන දිස්ත්‍රික් නිලධාරී (සමුපකාර සංවර්ධන නිලධාරී අධි ශ්‍රේණිය) | 05 | 00 | 05 |
| | භාෂා පරිවර්තක | 01 | - | 01 |
| | **එකතුව** | **07** | **00** | **07** |
| ද්විතිය මට්ටම | සමුපකාර සංවර්ධන නිලධාරී I සහ II ශ්‍රේණි | | 07 | |
| | සමුපකාර ප්‍රවර්ධන හා විමර්ශන සහකාර | } 62 | 25 } 54 | 08 |
| | සමුපකාර සංවර්ධන නිලධාරී III ශ්‍රේණිය | | 22 | |
| | සංවර්ධන නිලධාරී | 15 | 10 | 05 |
| | රාජ්‍ය කළමනාකරණ සහකාර | 28 | 21 | 07 |
| | **එකතුව** | 105 | 85 | 20 |
| ප්‍රාථමික මට්ටම | රියදුරු | 05 | 05 | - |
| | කාර්යාල කාර්ය සහායක | 15 | 12 | 03 |
| | **එකතුව** | **20** | **17** | **03** |
| | මුළු එකතුව | 141 | 108 | 33 |

## 01. 3.2 නව පත්වීම් ලබා පැමිණි නිලධාරින්

| | නම | තනතුර | පැමිණි දිනය |
|---|---|---|---|
| 1 | ජී.එම්.එස්. ගුරුසිංහ මිය | ර.ක.ස III | 2014.01.06 |
| 2 | එන්. ඒ. එම්. පිරිස් මෙය | ර.ක.ස III | 2014.01.06 |
| 3 | ඒ. එන්. කිඹියෙහෙට්ටි මෙය | ර.ක.ස III | 2014.01.06 |
| 4 | යූ. ඒ. එල්. ධනංජලි මෙය | ර.ක.ස III | 2014.01.06 |
| 5 | ඩී. එන්. කේ. කලංසූරිය මෙය | ර.ක.ස III | 2014.01.06 |
| 6 | එම්.ආර්.පී. තිලකරත්න මයා | රියදුරු II "ආ" | 2014.04.04 |
| 7 | පී. එම්. ජයන්ත බණ්ඩාර මයා | කා.සේ.සේ III | 2014.04.04 |
| 8 | ආර්. ඩී. ටී. ඒ. විමලදාස මයා | කා.සේ.සේ III | 2014.04.04 |

## 01. 3.3 ස්ථාන මාරුවීම් ලබා පැමිණි නිලධාරින්

| | නම | තනතුර | ස්ථාන මාරුවීම් ලබා පැමිණි දිනය |
|---|---|---|---|
| 1 | කේ. ටී. එම්. එම්. තෙන්නකෝන් මිය | රා.ක.ස. I | 2014.01.01 |
| 2 | සී. ඩී. පනාගොඩ මිය | රා.ක.ස. II | 2014.01.04 |

## 01. 3.4 කාර්ය මණ්ඩල විශ්‍රාම ගැන්වීම

| | නම | තනතුර | විශ්‍රාම ලැබූ දිනය |
|---|---|---|---|
| 01 | ජේ. එච්. සෙනරත් බණ්ඩාර මයා | සමුපකාර සංවර්ධන සහකාර කොමසාරිස් | 2014.04.05 |
| 02 | එච්. ජී. වී. ආර්. සෝමවර්ධන මිය | පරිපාලන නිලධාරි | 2014.06.10 |

## 01. 3.5 ස්ථාන මාරු වී ගිය නිලධාරින්

| | නම | තනතුර | ස්ථාන මාරු ලැබූ දිනය |
|---|---|---|---|
| 1 | බී. පී. විනිතා මිය | රා.ක.ස. I | 2014.01.08 |
| 2 | එස්. එම්. මදුරාවල මිය | රා.ක.ස. III | 2014.01.10 |
| 3 | ඩබ්ලිව්. එස්. එන්. පී. නානායක්කාර මිය | රා.ක.ස. II | 2014.01.13 |
| 4 | බී. ප්‍රේමරත්න මයා | රා.ක.ස. III | 2014.01.13 |
| 5 | අයි. එස්. තෙවරප්පෙරුම මිය | රා.ක.ස. II | 2014.01.17 |
| 6 | එච්. එන්. එල්. ජයසිංහ මිය | සංවර්ධන නිලධාරි | 2014.03.02 |
| 7 | එච්. එම්. එස්. එස්. බණ්ඩාර මිය | සංවර්ධන නිලධාරි | 2014.11.20 |

## 01. 4 කාර්ය මණ්ඩල පුහුණු කිරීම් සහ සංවර්ධනය

### 01. 4.1 දේශීය පුහුණු

2014 වර්ෂය තුළ දෙපාර්තමේන්තු කාර්ය මණ්ඩල සාමාජිකයින් පහත සඳහන් පරිදි දේශීය අධ්‍යාපන හා පුහුණු පාඨමාලාවන්ට සහභාගි කරවා ඇත.

| | පුහුණු වැඩසටහන | සංවිධානය කළ ආයතනයේ නම | කාලසීමාව | සහභාගි වූ නිලධාරීන් |
|---|---|---|---|---|
| 1 | විශ්‍රාම වැටුප් කටයුතු | ශ්‍රී ලංකා සංවර්ධන පරිපාලන ආයතනය | 2014.02.25-26 | එල්.එච්.සී.අයි. ද සිල්වා මිය (රාජ්‍ය කළමනාකරණ සහකාර) එම්.එම්. පෙරේරා මිය (රාජ්‍ය කළමනාකරණ සහකාර) |
| 2 | ආයතන සංග්‍රහයේ විධිවිධාන හා කාර්ය පරිපාටික රීති | ශ්‍රී ලංකා සංවර්ධන පරිපාලන ආයතනය | 2014.03.10 - 2014.03.12 | කේ.එම්. මිනෝලි මෙය (රාජ්‍ය කළමනාකරණ සහකාර) ඩබ්ලිව්.ආර්.එම්. පෙරේරා මෙය (සංවර්ධන නිලධාරි) |
| 3 | නව සිගාස් මෘදුකාංග | රාජ්‍ය ගිණුම් දෙපාර්තමේන්තුව | 2014.03.13 | කේ.ජී.එන්. රත්නායක මයා (රාජ්‍ය කළමනාකරණ සහකාර) |
| 4 | සිවිල් විශ්‍රාම වැටුප් ගණන් බැලීම් හා ගෙවීම් | නිපුනතා සංවර්ධන අරමුදල | 2014.03.20-21 | ආර්.එම්.පි.එස්. රත්නායක මයා (රාජ්‍ය කළමනාකරණ සහකාර) |
| 5 | Effective Management Skills for AO's | නිපුනතා සංවර්ධන අරමුදල | 2014.03.20-21 | පි.ජ්. පතිරත්න මෙය (රාජ්‍ය කළමනාකරණ සහකාර) |
| 6 | වැටුප් පරිවර්තන | ශ්‍රී ලංකා සංවර්ධන පරිපාලන ආයතනය | 2014.03.31 - 2014.04.01 | ඩබ්ලිව්.ආර්.එම්. පෙරේරා මිය (සංවර්ධන නිලධාරි) |
| 7 | රාජ්‍ය මූල්‍ය කළමනාකරණය | ශ්‍රී ලංකා සංවර්ධන පරිපාලන ආයතනය | 2014.05.08 - 2014.05.09 | එල්.ජී.යූ. නිශාන්ත මයා (රාජ්‍ය කළමනාකරණ සහකාර) |
| 8 | වැටුප් පරිවර්තන | ශ්‍රී ලංකා සංවර්ධන පරිපාලන ආයතනය | 2014.05.26-27 | ආර්එම්.පි.එස්. රත්නායක මයා (රාජ්‍ය කළමනාකරණ සහකාර) |
| 9 | සරප්/අයකැමි තනතුරේ කාර්යභාරය හා වගකීම් | නිපුනතා සංවර්ධන අරමුදල | 2014.05.28 | එල්.එච්.සී.අයි. ද සිල්වා මිය (රාජ්‍ය කළමනාකරණ සහකාර) |
| 10 | රාජ්‍ය මූල්‍ය කළමනාකරණය | ශ්‍රී ලංකා සංවර්ධන පරිපාලන ආයතනය | 2014.06.26-27 | ඒ.ඒ.එම්.එම්. තිලකරත්න මිය (සංවර්ධන නිලධාරි) |
| 11 | Cash Management and Cash Flow Control | නිපුනතා සංවර්ධන අරමුදල | 2014.06.30 | රොෂාන් ජයතිලක මයා (අරමුදල් ලිපිකරු) |
| 12 | ලේඛනාරක්ෂක නීතිය | ජාතික ලේඛණාරක්ෂක දෙපාර්තමේන්තුව | 2014.07.21-25 | කේ.එම්. මිනෝලි මෙය (රාජ්‍ය කළමනාකරණ සහකාර) |

| | | | | |
|---|---|---|---|---|
| 13 | රාජ්‍ය මූල්‍ය කළමනාකරණය | ශ්‍රී ලංකා සංවර්ධන පරිපාලන ආයතනය | 2014.08.18-19 | එල්.එච්.සී.අයි. ද සිල්වා මිය (රාජ්‍ය කළමනාකරණ සහකාර) |
| 14 | රාජ්‍ය මූල්‍ය කළමනාකරණය | ශ්‍රී ලංකා සංවර්ධන පරිපාලන ආයතනය | 2014.08.18-19 | ඒ.ඒ.සී.එස්. අමරසිංහ මිය (රාජ්‍ය කළමනාකරණ සහකාර)<br>කේ.එම්. මිනෝලි මෙය (රාජ්‍ය කළමනාකරණ සහකාර) |
| 15 | රජයේ නිලධාරීන්ට අයත් නීතියේ විධිවිධාන | රාජ්‍ය ගිණුම් දෙපාර්තමේන්තුව | 2014.08.26 | කේ.ඒ.එන්. රත්නායක මයා (රාජ්‍ය කළමනාකරණ සහකාර) |
| 16 | නවක රාජ්‍ය කළමනාකරණ සහකාර සේවයේ නිලධාරීන්ගේ සේවාරම්භක පුහුණු පාඨමාලාව | දිස්ත්‍රික් ලේකම් කාර්යාල | 2014.08.25 - 2014.08.05 | අචිනි නිසංසලා මෙය (රාජ්‍ය කළමනාකරණ සහකාර)<br>අචිනි හසන්තිකා මෙය (රාජ්‍ය කළමනාකරණ සහකාර)<br>නිපුනි ධනංජලී මෙය (රාජ්‍ය කළමනාකරණ සහකාර)<br>මහේෂිකා මධුරංගි මෙය (රාජ්‍ය කළමනාකරණ සහකාර) |
| 17 | රජයේ විශ්‍රාම වැටුප් සම්බන්ධ ගැටලු | දිස්ත්‍රික් ලේකම් කාර්යාල - කොළඹ | 2014.09.15 | ආර්.එම්.පී.එස්. රත්නායක මයා (රාජ්‍ය කළමනාකරණ සහකාර)<br>ඩබ්ලිව්.ආර්.එම්. පෙරේරා මෙය (රාජ්‍ය කළමනාකරණ සහකාර) |
| 18 | මානව සම්පත් කළමනාකරණය | ශ්‍රී ලංකා සංවර්ධන පරිපාලන ආයතනය | 2014.09.17-19 | ජී.පී.ටී.පී. ගනේගොඩ මෙය (සංවර්ධන නිලධාරි)<br>පබසරී මදාරා මෙය (සංවර්ධන නිලධාරි) |
| 19 | Import and Export Procedure | නිපුනතා සංවර්ධන අරමුදල | 2014.09.22-23 | ප්‍රියන්තා පීරිස් මිය (දිස්ත්‍රික් නිලධාරි)<br>සුමුදු නන්දසේන මෙය (සමුපකාර ප්‍රවර්ධන හා විමර්ශන සහකාර) |
| 20 | විශ්‍රාම වැටුප් ගෙවීමේ ක්‍රියාවලිය විධිමත් කිරීම | විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුව | 2014.11.17 | ඩබ්ලිව්.ආර්.එම්. පෙරේරා මෙය (සංවර්ධන නිලධාරි)<br>ආර්.එම්.පී.එස්. රත්නායක මයා (රාජ්‍ය කළමනාකරණ සහකාර) |
| 21 | රාජ්‍ය ලේඛන පරිපාලනය සහ ලේඛනාරක්ෂක නීතිය | ජාතික ලේඛනාරක්ෂක දෙපාර්තමේන්තුව | 2014.11.18 | එච්.එස්. ෆොන්සේකා මිය (නියෝජ්‍ය කොමසාරිස්) |
| 22 | රාජ්‍ය භාෂා ප්‍රතිපත්ති සම්බන්ධයෙන් සංස්ථා සහ ව්‍යවස්ථාපිත මණ්ඩල වල නිලධාරින් දැනුවත් කිරීමේ වැඩසටහන | ජාතික භාෂා හා සමාජ ඒකාබද්ධ අමාත්‍යංශය | 2014.11.28 | බී.එම්. බන්දුල මයා (දිස්ත්‍රික් නිලධාරි)<br>පී.ඒ. පතිරත්න මෙය (රාජ්‍ය කළමනාකරණ සහකාර)<br>කේ.එච්.ජී.කේ. කුමාර මයා (රාජ්‍ය කළමනාකරණ සහකාර)<br>එම්.එන්.එල්. පීරිස් මිය (රාජ්‍ය කළමනාකරණ සහකාර)<br>කේ.ආර්.ටී. සෝමරත්න මිය (සංවර්ධන නිලධාරි)<br>යූ.එල්. නිපුනි ධනංජලී මෙය (රාජ්‍ය කළමනාකරණ සහකාර) |

## 01. 4.2 විදේශීය පුහුණු

2014 වර්ෂය තුළ දෙපාර්තමේන්තු කාර්ය මණ්ඩල සාමාජිකයන් පහත සඳහන් පරිදි විදේශීය අධ්‍යාපන, පුහුණු, ශිෂ්‍යත්ව හා සම්මන්ත්‍රන සඳහා සහභාගවී ඇත.

| අනු අංකය | වැඩසටහන | කාල පරිච්ජේදය | සහභාගි වූ නිලධාරින් |
|---|---|---|---|
| 01 | $7^{th}$ Regulators/ Administrators Conference on the Blueprint for Strengthened (Enabling) Regulatory Framework Credit Co-operatives in Asia (Thailand) | 2014.03.06<br>2014.03.10 | Mr. W.H. Karunarathna (Commissioner of co-operative Development) |
| 02 | Seminar on NEDAC (Bangaladesh) | 2014.04.03<br>2014.04.11 | Ms. J.M.H.N.G. Jayasekara (Assistant Commissioner) |
| 03 | සමුපකාර අධ්‍යාපන සහ සමුපකාර ව්‍යාපාරයේ නව ප්‍රවනතා පිළිබඳ සංචාරය (China) | 2014.08.26<br>2014.08.312 | Mrs. H.S. Fonseka Act. Dep. Commissioner (Admin) |
| 04 | Training of NEDAC Co-operative Personal (INdia) | 2014.11.17<br>2014.11.22 | Ms. J.M.H.N.G. Jayasekara (Assistant Commissioner) |

## 01. 4.3 මහජන බැංකු ආධාර මගින් සිදු කරනු ලැබූ පුහුණු වැඩසටහන්

| අනු අංකය | පුහුණු වැඩසටහන | පැවැත්වූ දිනය | සහභාගි වූ පිරිස |
|---|---|---|---|
| 01 | පළාත් දෙපාර්තමේන්තු නිලධාරීන් සඳහා සංඛ්‍යා ලේඛන වැඩමුළුව | 2014.03.18 | පළාත් දෙපාර්තමේන්තු නිලධාරීන් |
| 02 | සමුපකාර සංවර්ධන නිලධාරීන්ගේ කාර්යභාරය පිළිබඳ දැනුවත් කිරීමේ වැඩමුළුව | 2014.04.07 | සමුපකාර සංවර්ධන නිලධාරින් සහ සමුපකාර ප්‍රවර්ධන හා විමර්ෂන සහකාර |
| 03 | රාජ්‍ය කළමණාකරණ සේවයේ කාර්යක්‍ෂමතා කඩඉම් විභාගය පිළිබඳ වැඩමුළුව | 2014.06.3 | දෙපාර්තමේන්තු නිලධාරීන් |
| 04 | මුදල් රෙගුලාසි පිළිබඳ දැනුවත් කිරීමේ පුහුණු වැඩසටහන | 2014.06.21 | දෙපාර්තමේන්තු නිලධාරීන් |

## 01. 5 රජයේ විගණනය

විගණකාධිපති දෙපාර්තමේන්තුවේ නිලධාරීන් විසින් දෙපාර්තමේන්තු කාර්යයන් සහ අවසන් ගිණුම් විගණනය කිරීම සිදු කරනු ලබයි.

දෙපාර්තමේන්තුවේ අභ්‍යන්තර විගණන කටයුතු, සමුපකාර හා අභ්‍යන්තර වෙළෙඳ අමාත්‍යංශයේ අභ්‍යන්තර විගණන ඒකකය විසින් කාර්තුමය වශයෙන් සිදු කරනු ලබයි.

2014 වර්ෂය තුළ දෙපාර්තමේන්තු කාර්යයන් වලට අදාලව රජයේ විගණන අංශය විසින් විගණන විමසුම් 24 ක් එවා ඇති අතර ඒ සඳහා පිළිතුරු යවා අවසන් කර ඇත.

# පරිච්ඡේදය 02

## සංවර්ධන ක්‍රියාකාරකම්

### 02. 1 2014 වර්ෂයේ ලියාපදිංචි කරන ලද සමුපකාර සමිති

| සමිතියේ නම | ලි.ප.අං. | ලි.ප. කල දිනය |
|---|---|---|
| • සී/ස ප්‍රජාශක්ති තරුණ අභිවෘද්ධි සමුපකාර සමිතිය | සමු.43 | 2014.08.06 |
| • සී/ස රාජ්‍ය කළමනාකරණ සහකාර සේවා නිලධාරීන්ගේ ඉතිරි කිරීමේ හා සංවර්ධන සේවා සමුපකාර සමිතිය | සමු.44 | 2014.08.12 |
| • සී/ස කිරි නිෂ්පාදකයින්ගේ ජාතික සමුපකාර සමිතිය | සමු.45 | 2014.10.02 |

### 02. 2 සමුපකාර සමිතිවල අතුරු ව්‍යවස්ථා සංශෝධනය කිරීම

2014.10.03 වන දින සී/ස සතොස සේවකයන්ගේ සමුපකාර සකසුරුවම් සුභ සාධක සහ ණය දෙන සමිතියේ අතුරු ව්‍යවස්ථා සංශෝධනය අනුමත කිරීම.


### 02. 3 සමුපකාර සමිති සංගම් නිලවරණ පැවැත්වීම්


| සමිතියේ/සංගමයේ නම | නිලවරණය පැවැත්වූ දිනය |
|---|---|
| • සී/ස රෙජිස්ට්‍රාර් දෙපාර්තමේන්තු සේවකයින්ගේ සකසුරුවම් හා ණය ගනුදෙනු පිළිබඳ සමිතිය | 2014.03.07 |
| • සී/ස සමස්ත ලංකා අභ්‍යාස පොත් නිපදවන්නන්ගේ සමුපකාර සමිතිය | 2014.04.04 |
| • සී/ස දුම්රිය ස්ථානාධිපතිවරුන්ගේ සහ ලිපිකරුවන්ගේ සමුපකාර සකසුරුවම් ඉතිරි කිරීමේ හා ණය දෙන සමිතිය | 2014.05.22 |
| • සී/ස ශ්‍රී ලංකා පාරිභෝගික සමුපකාර සමිතිය | 2014.05.31 |
| • සී/ස ජාතික ජල සම්පාදන හා ජලාප්‍රවාහන මණ්ඩලයේ සමස්ථ සේවකයින්ගේ සකසුරුවම් හා ණය ගනුදෙනු පිළිබඳ සමුපකාර සමිතිය | 2014.07.17 |
| • සී/ස ශ්‍රී ලංකා සෞඛ්‍ය කාර්ය මණ්ඩල සංවර්ධන සේවා සමුපකාර සමිතිය | 2014.08.05 |
| • සී/ස සතොස සේවකයන්ගේ සමුපකාර සකසුරුවම් සුභ සාධක සහ ණය දෙන සමිතිය | 2014.10.03 |

## 02. 4 සමුපකාර සමිතිවල ව්‍යවස්ථාපිත විගණන කටයුතු

දෙපාර්තමේන්තුවේ ව්‍යවස්ථාපිත විගණන කටයුතු යටතේ විගණනය කළ යුතු සමුපකාර සමිති/සංගම්වල 2009 සිට 2014 වර්ෂය දක්වා විගණන සැලසුම් සහ ප්‍රගතිය පහත දැක්වේ.

| වර්ෂය | සැලසුම් කල විගණන | නිම කල විගණන | වර්ෂය තුල නිම කළ විගණනයන්හි ප්‍රතිශතය |
|---|---|---|---|
| 2009 | 55 | 45 | 82% |
| 2010 | 58 | 53 | 91% |
| 2011 | 66 | 64 | 97% |
| 2012 | 83 | 63 | 76% |
| 2013 | 74 | 61 | 82% |
| 2014 | 68 | 44 | 64.7% |



## 02. 5 නීති කටයුතු

### 02. 5.1 ආරවුල් බේරුම්කරය

1992 අංක 11 හා 1983 අංක 32 දරණ සංශෝධන පනත් සමග කියවෙන 1972 අංක 5 දරණ සමුපකාර සමිති පනතේ 58 වන වගන්තිය ප්‍රකාරව සමුපකාර සමිති වලින් බේරුම්කරණය සඳහා 2014 වසර තුළ දෙපාර්තමේන්තුව වෙත යොමු කර ඇති ගොනුවල සාරාංශය පහත පරිදි වේ.

| විස්තරය | එකතුව |
|---|---|
| 2014.01.01 දිනට බේරුම්කරණය වෙත යොමු කිරීමට තිබූ ගොනු සංඛ්‍යාව | 545 |
| 2014 වර්ෂය තුළ බේරුම්කරණය සඳහා ලද ගොනු සංඛ්‍යාව | 24 |
| 2014 වර්ෂය තුළ බේරුම්කරණය සඳහා යොමු කල සංඛ්‍යාව | 326 |
| 2014.12.31 දිනට නීති අංශය සතු ගොනු සංඛ්‍යාව | 243 |
| 2014 වර්ෂය තුළ ප්‍රදානයන් ලබාදී ඇති ගොනු සංඛ්‍යාව | 403 |

### 02. 5.2 උසාවි බලගැන්වීම්

1972 අංක 5 දරණ සමුපකාර සමිති පනතේ 58 වන වගන්තිය යටතේ සමුපකාර සමිති විසින් බේරුම්කරණය සඳහා යොමු කරනු ලබන ආරවුල් සඳහා තීරක තීන්දු ලබා දීමෙන් පසු අදාල මුදල් ණයකරුවන් විසින් නොගෙවන්නේනම් සමුපකාර සංවර්ධන කොමසාරිස් විසින් එම මුදල අය කර දීමට අදාල මහේස්ත්‍රාත් අධිකරණය හැර බලගන්වන අතර එසේ අධිකරණයෙන් අය වන මුදල් නැවත අදාල සමුපකාර සමිතිය වෙත ප්‍රේෂනය කරනු ලැබේ.

| | |
|---|---|
| 2014 වර්ෂය ආරම්භයේ උසාවි ගත කිරීමට තිබූ ඉල්ලීම් සංඛ්‍යාව | 1250 |
| වර්ෂය තුළ උසාවි ගත කිරීමට ලැබී ඇති ඉල්ලීම් සංඛ්‍යාව | 245 |
| වර්ෂය තුළදී උසාවි ගත කළ බේරුම්කරණ තීන්දු සංඛ්‍යාව | 423 |
| වර්ෂ අවසානයේදී උසාවි බලගැන්වීමට ඇති ඉල්ලීම් ලිපි සංඛ්‍යාව | 1072 |

### 02. 5.3 වර්ෂය තුළ අවසන් වූ නඩු

| නඩු අංකය | පාර්ශවකාර සමිතිය |
|---|---|
| ප්‍රති 5 මහනුවර මහාධිකරණය | සී/ස මානව සම්පත් සංවර්ධන සමුපකාර සමිතිය |
| ප්‍රති 55 ගාල්ල මහාධිකරණය | සී/ස මානව සම්පත් සංවර්ධන සමුපකාර සමිතිය |
| SC/FR/233/2013 කොළඹ ශ්‍රේෂ්ඨාධිකරණය | සී/ස ජලසම්පාදන මණ්ඩලයේ සමස්ථ සේවකයින්ගේ සකසුරුවම් හා ණය ගනුදෙනු පිළිබඳ සමුපකාර සමිතිය |

## 02. 5.4 සමුපකාර සමිති/ සංගම් පිළිබඳ පරීක්ෂණ

සී/ස පාරිභෝගික සමුපකාර සමිතිය සංගමයට අදාළව 2014 වර්ෂයේදී හදිසි පරීක්ෂණයක් පවත්වන ලද අතර, සී/ස ජාතික සමුපකාර මණ්ඩලයේ සිමෙන්ති ආනයනය පිළිබඳ විශේෂ විගණනයක් සිදු කරන ලදී.

## 02. 6 අරමුදල් කළමනාකරණය

1972 අංක 05 දරන සමුපකාර සමිති පනතේ 43 (1) (ආ) වගන්තිය සහ 57 (3) වගන්තිය යටතේ පිහිටුවන ලද පහත සඳහන් අරමුදල් මෙම වර්ෂය තුළදී ද සමුපකාර සංවර්ධන කොමසාරිස්වරයා භාරයේ පැවති අතර, එම අරමුදල ගරු අමාත්‍යතුමාගේ අධීක්ෂණය හා විධානයට යටත්ව අමාත්‍යාංශ ලේකම්වරයාගේ සභාපතිත්වයෙන් යුත් අරමුදල් කමිටුවක තීරණ අනුව කළමනාකරණය කරනු ලබයි.

- සමුපකාර අරමුදල
- සමුපකාර අතිරික්ත අරමුදල

## 02. 6.1 සමුපකාර අරමුදල

සමුපකාර සමිති ආඥා පනතේ (107 වැනි අධිකාරිය) 46 වගන්තිය යටතේ පනවා ඇති අංක 10086 සහ 1950.03.24 වැනි දින රජයේ ගැසට් පත්‍රයේ පලකරන ලද නියෝග මාලාව යටතේ පිහිටුවා ඇති මෙම අරමුදලට දායකත්වය දෙනු ලබන්නේ දෙපාර්තමේන්තුව යටතේ ලියාපදිංචි වී ඇති සමුපකාර සංගම් හා දීප ව්‍යාප්ත සමුපකාර සමිති විසිනි.

**2014 වසර තුළදී සමුපකාර අරමුදලින් ක්‍රියාත්මක කරන ලද වැඩසටහන් හා ව්‍යාපෘති**

| | අරමුදල් ලබා දුන් ආයතනය | මෙම වසර තුල ලබාදුන් ආධාර මුදල (රු.මි.) | කාරණය |
|---|---|---|---|
| 01 | ශාන්ත ආනා විද්‍යාලය කුරුණෑගල | 14.25 | ශාන්ත ආනා විද්‍යාලයේ පිහිනුම් ප්‍රේක්ෂකාගාරය ඉදි කිරීම |
| 02 | ජාතික සමුපකාර සංවර්ධන ආයතනය පොල්ගොල්ල | 4.05 | නිවාඩු නිකේතනය අළුත්වැඩියා කිරීම |
| | එකතුව | 18.30 | |

## 02. 6.2 සමුපකාර අතිරික්ත අරමුදල

අංක 93/5 දරන 1974 ජනවාරි 10 දිනැති විශේෂ ගැසට් පත්‍රයේ 44(i) සිට 44 (iii) දක්වා සඳහන්ව ඇති ලියාපදිංචි සමිතියක් ඈවර කිරීම අවසන් කරනු ලැබූ හා එකී සමිතියේ යම් ණය හිමියෙක් විසින් වත්කම් බෙදාදීමේ යෝජනා ක්‍රමය යටතේ තමාට අයවිය යුතු දේ සම්බන්ධයෙන් හිමිකම් කියාපෑම ඉදිරිපත් කරනු නොලැබ ඉතිරිවන අතිරික්තයක් යෙදවීමෙන් මෙකී සමුපකාර අතිරික්ත අරමුදල මූල්‍යනය වන අතර, මෙම වර්ෂය තුලදී පළාත් සමුපකාර සමිති වල කටයුතු වැඩි දියුණු කිරීම සඳහා සහන පොලි ප්‍රතිශතයක් යටතේ පහත පරිදි මූල්‍ය ප්‍රතිපාදන සලසා ඇත.

### සමුපකාර අතිරික්ත අරමුදල - ණය ලබා දීම - 2014

| | ආයතනය | මෙම වසර තුළ ලබාදුන් ණයමුදල (රු.මි.) | කාරණය |
|---|---|---|---|
| 1 | සී/ස නිකවැරටිය සංවර්ධන සමුපකාර සමිතිය | 4.00 | හාතලව මාතෘ සායනය ඉදි කිරීම |
| 2 | සී/ස ඉංජිනේරු සංස්ථායීය සණසස සමිතිය | 5.00 | සාමාජිකයින් සඳහා අළුත් අවුරුදු ණය ලබා දීම |
| 3 | සී/ස කොබෙයිගනේ විවිධ සේවා සමුපකාර සමිතිය | 7.00 | ඉන්ධනහල නවීකරණය |
| 4 | ජාතික සමුපකාර සංවර්ධන ආයතනය - පොල්ගොල්ල | 25.00 | ශ්‍රවණාගාර ගොඩනැගිල්ල ඉදි කිරීම |
| | **එකතුව** | **41.00** | |

### සමුපකාර අතිරික්ත අරමුදල - ආධාර ලබාදීම - 2014

| | ආයතනය | මෙම වසර තුළ ලබාදුන් ආධාර මුදල (රු.මි.) | කාරණය |
|---|---|---|---|
| 1 | නිකවැරටිය මහසෙන් විද්‍යාලය | 0.50 | පිහිනුම් තටාකය සඳහා විදුලිය ලබා ගැනීම |
| 2 | ජාතික සමුපකාර සංවර්ධන ආයතනය - පොල්ගොල්ල | 11.52 | නිවාඩු නිකේතනය අළුත්වැඩියා කිරීම |
| | **එකතුව** | **12.02** | |

## 02. 7 2014 වර්ෂය සඳහා රජයේ අයවැය මඟින් වෙන් කළ මූල්‍ය ප්‍රතිපාදන හා වියදම් දැරීම

| වැය විෂය අංකය | කාණ්ඩය/වැය විෂයය / අයිතම විස්තරය | ශුද්ධ ප්‍රතිපාදන රු. | 2014-12-31 දිනට මුළු වියදම රු. |
|---|---|---|---|
| 1001 | වැටුප් හා වේතන | 23,000,000.00 | 22,708,739.15 |
| 1002 | අතිකාල හා නිවාඩු දින වැටුප් | 775,000.00 | 785,160.96 |
| 1003 | වෙනත් දීමනා | 13,000,000.00 | 15,999,958.82 |
| 1101 | ගමන් වියදම් - දේශීය | 2,000,000.00 | 2,452,360.61 |
| 1102 | ගමන් වියදම් - විදේශීය | 800,000.00 | 232,407.69 |
| 1201 | ලිපි ද්‍රව්‍ය හා කාර්යාලීය අවශ්‍යතා | 1,000,000.00 | 999,033.92 |
| 1202 | ඉන්ධන | 2,500,000.00 | 2,926,759.65 |
| 1203 | ආහාරපාන හා නිල ඇඳුම් | 100,000.00 | 70,435.00 |
| 1301 | වාහන | 1,400,000.00 | 2,168,590.66 |
| 1302 | යන්ත්‍ර සහ උපකරණ | 650,000.00 | 850,837.09 |
| 1402 | තැපැල් හා සන්නිවේදනය | 900,000.00 | 1,216,590.66 |
| 1403 | විදුලිය හා ජලය | 2,500,000.00 | 2,493,809.69 |
| 1405 | වෙනත් | 2,000,000.00 | 1,793,299.66 |
| 1505 | සම්මාදම් සහ දායක මුදල් | 350,000.00 | 331,159.53 |
| 1506 | රජයේ සේවකයන් සඳහා දේපල ණය පොලී | 600,000.00 | 510,239.55 |
| | **එකතුව** | **51,575,000.00** | **55,539,180.39** |

### මූලධන වියදම්

| වැය විෂය අංකය | කාණ්ඩය/වැය විෂයය / අයිතම විස්තරය | ශුද්ධ ප්‍රතිපාදන රු. | 2013-12-31 දිනට මුළු වියදම රු. |
|---|---|---|---|
| 2002 | යන්ත්‍ර සහ යන්ත්‍රෝපකරණ | 100,000.00 | 84,000.00 |
| 2003 | වාහන | 500,000.00 | 494,262.14 |
| 2102 | ගෘහභාණ්ඩ සහ කාර්යාලීය උපකරණ | 300,000.00 | 296,565.00 |
| 2103 | යන්ත්‍ර සහ යන්ත්‍රෝපකරණ | 400,000.00 | 379,934.80 |
| 2401 | පුහුණු කිරීම් සහ හැකියා වර්ධනය | 100,000.00 | 43,500.00 |
| 2502-1 | ප්‍රකාශනය හා ප්‍රචාරණය | 400,000.00 | 325,439.68 |
| 2502-2 | මූල්‍ය සේවා නියාමන | 7,100,000.00 | 5,402,535.72 |
| 2502-3 | සමූපදීපනී | 7,500,000.00 | 5,712,000.00 |
| | **එකතුව** | **16,400,000.00** | **12,738,237.34** |

### වියදම්

| | විස්තරය | ශුද්ධ ප්‍රතිපාදන රු. | 2013-12-31 දිනට මුළු වියදම රු. |
|---|---|---|---|
| 01 | පුනරාවර්තන වියදම් එකතුව | 51,575,000.00 | 55,539,180.39 |
| 02 | මූලධන වියදම් එකතුව | 16,400,000.00 | 12,738,237.34 |
| | මුළු එකතුව | **67,975,000.00** | **68,277,417.73** |

## 02. 8 ග්‍රාමීය බැංකු නියාමනය

සමුපකාර ක්ෂේත්‍රයේ මූල්‍ය ක්‍රියාකාරකම්හි නියුතු සමිති හා සමාගම්වල මූල්‍ය විනයක් ඇති කිරීම, එම අංශ ශක්තිමත් කිරීම හා යහපාලනය තුළින් සමුපකාර මූල්‍ය අංශ ව්‍යාප්ත කිරීම අරමුණු කොටගෙන දෙපාර්තමේන්තුව තුල ස්ථාපිත කරන ලද බැංකු නියාමන ඒකකය 2014 වර්ෂය තුළදී පහත සඳහන් සංවර්ධන කාර්යයන්හි යෙදී ඇත.

- බැංකු නියාමන ජාතික කමිටු රැස්වීම් 05 ක් පැවැත්වීම තුළින් බැංකු නියාමනයට අදාල ක්‍රියාකාරකම් හා ඇතිවන ගැටළු පිළිබඳ පළාත් මට්ටමින් සාකච්ඡා කිරීම.

- බැංකු නියාමන පිළිබඳ සියලු පළාත්වල දෙපාර්තමේන්තු හා සමිති/සමාගම් නිලධාරීන් දැනුවත් කිරීම සඳහා දිස්ත්‍රික් මට්ටමින් වර්ෂය තුළ එක් දින වැඩසටහන් 22 ක් පැවැත්වීම.

- සියළු පළාත් කොමසාරිස්වරුන් වෙත උපදෙස් පත්‍රිකා නිකුත් කිරීම සහ පළාත් කොමසාරිස්වරුන් විසින් එම උපදෙස් චක්‍රලේඛ ලෙස නිකුත් කිරීම.

- පළාත් මට්ටමින් පුහුණුකරන්නන් කණ්ඩායමක් තෝරාගෙන ඔවුන්ගේ කුසලතා වර්ධනයට සහ දැනුම වැඩිදියුණු කිරීම සඳහා පුහුණු වැඩසටහන් 09 ක් පැවැත්වීම.

- සණස සහ විවිධ සේවා සමිති සඳහා නව ඒකීය ගිණුම් ආකෘති සකස් කිරීමේ වැඩසටහන් 06 ක් පැවැත්වීම සහ පළාත්වලට ආකෘති පත්‍ර යැවීම.

- F28 වාර්තාව නව මුහුනුවරකින් ඉදිරිපත් කිරීම සඳහා වැඩසටහන් 05 ක් පවත්වා අවසන් කෙටුම්පත් සකස් කිරීම.

- ග්‍රාමීය බැංකුවල භෞතික සම්පත් සංවර්ධනය කිරීමේ අරමුණින් වයඹ පළාත සඳහා රු. මිලියන 09 ක් වැය කර ග්‍රාමීය බැංකු 32 ක් නවීකරණය කිරීම සිදු කර ඇත.

- පළාත් බැංකු නියමනය පිළිබඳ සැලසුම් සමලෝචන වැඩසටහන් 02 ක් පවත්වා සියළුම පළාත්වල බැංකු නියාමන සැලසුම් සමාලෝචන කටයුතු සිදු කිරීම.

- රේඛීය දෙපාර්තමේන්තුව යටතේ ඇති සියළුම සමිතිවල 2013.12.31 දිනට මූල්‍ය තත්ත්ව විශ්ලේෂණ වාර්තා ලබා ගැනීම, ස්ථානීය හා එතැන් පරීක්ෂණ 05 ක් පැවැත්වීම.

- බැංකු නියාමනය සඳහා නෛතික පදනමක් සකස් කර ගැනීම සඳහා මූලික යෝජනාවලිය කෙටුම්පත් කිරීම.

- සියළුම පළාත් සම්බන්ධීකරණය කරමින් ග්‍රාමීය බැංකු හා මූල්‍ය සේවා සමිතිවල තොරතුරු රැස් කිරීම හා ශ්‍රී ලංකා මහ බැංකුවට කාර්තුමය වශයෙන් යොමු කිරීම.

## 02. 9 ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම

01. සුපිරි වෙළඳසැල් ඉදිකිරීම

සුපිරි වෙළඳසැල් සංකල්පය සමුපකාර ව්‍යාපාරය තුල ප්‍රවර්ධනය කිරීම අරමුණු කර ගනිමින් කෑගල්ල, වෙන්නප්පුව, දඹදෙණිය හා රිදීගම යන ස්ථානයන්හිදී මෙගා කෝප්සිටි සුපිරි වෙළඳසැල් ආරම්භ කරන ලදී. එක් සුපිරි වෙළඳසැලක් සඳහා අමාත්‍යංශ මුලධන ප්‍රතිපාදන යටතේ රුපියල් මිලියන 2.5 බැගින් ආ පලාත් සමුපකාර සංවර්ධන දෙපාර්තමේන්තු හා සම්බන්ධීකරණය වෙමින් ලබා දී ඇත.

02. ඒකාබද්ධ අත්‍යාවශ්‍ය භාණ්ඩ මිලදී ගැනීමේ වැඩසටහන

පළාත් මට්ටමින් පාරිභෝගික ජනතාවට ඉහල ගුණාත්මක භාවයකින් යුක්ත අත්‍යාවශ්‍ය භාණ්ඩ 08 ක් සාධාරණ මිලකට ලබා දීමට සතිපතා මිල කැඳවීම පළාත් මට්ටමින් සිදු කරන අතර, ඒ හරහා පාරිභෝගික ජනතාවට ඉහල ගුණාත්මකභාවයෙන් යුක්ත භාණ්ඩ ලබා දීම සම්බන්ධීකරණය කිරීම මෙම වසර තුළදීත් සිදු කරන ලදී.

03. ප්‍රතිනිර්මාණය කරන ලද වෙබ් අඩවිය ප්‍රජාව සඳහා එළි දැක්වීම

දෙපාර්තමේන්තුව සඳහා නව මුහුණුවරක් යටතේ කාලීන තොරතුරු සමඟ නව වෙබ් අඩවියක් එළිදැක්වීම 2014 ජුලි මස 01 වන දින ජාත්‍යන්තර සමුපකාර දිනයට සමගාමීව සිදු කළ අතර සමුපකාර ව්‍යාපාරය පිළිබඳ උනන්දුවක් දක්වන්නන් වෙත තොරතුරු ලබා දෙන්නා වූ තවත් එක් තෝතැන්නක් ලෙස දෙපාර්තමේන්තු වෙබ් අඩවිය යාවත්කාලීන කරමින් පවත්වා ගෙන යනු ලබයි.

04. නිල ලාංඡනය එළි දැක්වීම

වසර 83 ක ඉතිහාසයකට හිමිකම් කියන සමුපකාර සංවර්ධන දෙපාර්තමේන්තුව වෙනුවෙන් ප්‍රථම වරට නිල ලාංඡනයක් හඳුන්වාදීම මෙම වසරේදී සිදු කළ අතර **"එකා සැමටත් සැම එකාටත්"** යන සංකල්පය යටතේ මෙම නිල ලාංඡනය සමුපකාර සංවර්ධන දෙපාර්තමේන්තුව සඳහා හඳුන්වාදීම ජාත්‍යන්තර සමුපකාර දිනයට සමගාමීව සිදු කරන ලදී.

05. දැයට කිරුළ ජාතික සංවර්ධන අධ්‍යාපන ප්‍රදර්ශනය

සමුපකාර සමිති මුල්‍යමය වශයෙන් නගා සිටුවීම අරමුණු කර ගනිමින් 2014 දැයට කිරුළ සංවර්ධන ප්‍රදර්ශනයට සමගාමීව හාතලව මාතෘ සායනය ඉදි කිරීමේ කොන්ත්‍රාත්තුව ලබා ගැනීම සඳහා සී/ස නිකවැරටිය විවිධ සේවා සමුපකාර සමිතිය වෙත රුපියල් මිලියන 4ක ණය මුදලක් ලබා දෙන ලද අතර මේ වන විට ඉදි කිරීමේ කටයුතු අවසන් කර මව්වරුන් සඳහා සායන මධ්‍යස්ථානයක් පවත්වාගෙන යනු ලබයි.

06. නව ශ්‍රවනාගාරයක් ඉදි කිරීම

සමුපකාර හා අභ්‍යන්තර වෙළඳ අමාත්‍යංශය යටතේ පවතින ජාතික සමුපකාර සංවර්ධන ආයතනය, මුල්‍යමය වශයෙන් ස්ථාවර කිරීම සඳහා සංවර්ධන ව්‍යාපෘතියක් ලෙස ශ්‍රවණාගාරයක් ඉදි කළ අතර එම ශ්‍රවණාගාරය ඉදි කිරීම සඳහා වූ භාණ්ඩාගාර මූලධන ප්‍රතිපාදන ලැබෙන තෙක් සමුපකාර අරමුදල මගින් මෙම වසරේදී රුපියල් මිලියන 25 ක මුල්‍ය ප්‍රතිපාදන ලබා දී ශ්‍රවණාගාරය ඉදි කිරීමේ කටයුතු අවසන් කරන ලදී.

07. සමුපකාර ඉන්ධනහල් නවීකරණය

සී/ස කොබෙයිගනේ විවිධ සේවා සමුපකාර සමිතියට අයත් වන කොබෙයිගනේ පිහිටි ඉන්ධනහලක් නවීකරණය කිරීම සඳහා පෙර වර්ෂයේ ලබා දුන් රුපියල් මිලියන 10 ට අමතරව රුපියල් මිලියන 7 ක ණය මුදලක් ලබා දෙන ලදී.

## 02. 10 සැලසුම් කටයුතු

01. සංඛ්‍යා ලේඛන වාර්තාව

සමුපකාර ව්‍යාපාරය පිළිබඳ ලංකික ජනතාව දැනුවත් කිරීම හා අවබෝධයක් ලබා දීම අරමුණු කර ගනිමින් නව ආකෘතියක් යටතේ වඩා නිරවද්‍ය වූ දත්ත සහිත 2013 සංඛ්‍යාන ලේඛන වාර්තාව එළි දැක්වීම සිදුවිය.

02. කාර්ය සාධන වාර්තාව

සමුපකාර සංවර්ධන දෙපාර්තමේන්තුව පිළිබඳ තත් කාලීන තොරතුරු ඇතුලත් කරමින් සකස් කරන ලද 2013 වසරේ කාර්ය සාධන වාර්තාව මුද්‍රණය කටයුතු අවසන් කරන ලදී.

03. ක්‍රියාකාරී සැලැස්ම

2014 වර්ෂයේ සමුපකාර සංවර්ධන දෙපාර්තමේන්තුවෙහි ක්‍රියාත්මකභාවය සැලසුම් ගත කිරීම හා කාර්යක්ෂම කිරීම අරමුණු කර ගනිමින් වර්ෂ ආරම්භයේදී සියළු අංශයන්හි කාර්යභාරය ඒකාබද්ධ කරමින් ක්‍රියාකාරී සැලැස්ම සකස් කරන ලදී.

එමෙන්ම සමුපකාර ව්‍යාපාරය පිළිබඳ මහ බැංකුව, ජන හා සංඛ්‍යා ලේඛන දෙපාර්තමේන්තුව වැනි රාජ්‍ය මෙන්ම රාජ්‍ය නොවන ආයතන වෙත ව්‍යාපාරය පිළිබඳ අවශ්‍ය තොරතුරු ලබා දීමද මෙම වසර තුළදී සිදු කරන ලදී.

## 02. 11 මාධ්‍ය කටයුතු

වසර අටක කාලයක් පුරා අඛණ්ඩව පළවන සමුපදීපනී පුවත්පත් අතිරේකය 2014 වර්ෂයේ ජනවාරි මස සිට නව මුහුණුවරකින් පාඨකයා අතට පත් විය. එතෙක් මුල් පිටුව සමග පිටු කිහිපයක් පමණක් වර්ණ ගන්වා තිබූ නමුත්, 2014 වසරේ ජනවාරි සිට පිටු සියල්ල වර්ණ කඩදාසියේ මුද්‍රණය කිරීමට කටයුතු කරන ලදී. සමුපකාර ව්‍යාපාරයේ වර්ධනය උදෙසා ආකර්ෂණීය ලෙස පුවත්පත් අන්තර්ගතයේ ද යම් යම් වෙනස්කම් සිදු කරමින් වසර පුරාම සාර්ථක ලෙස පාඨකයා අතට පත් කිරීමට හැකි වූ සමුපදීපනී පුවත්පත සෑම මසකම අවසන් සිකුරාදා, දිනමිණ හා තිනකරන් පුවත්පත් සමග අතිරේකයක් ලෙස නිකුත් කරනු ලබයි.

# පරිච්ඡේදය 03

## ජාතික මට්ටමේ සමුපකාර සංවිධාන

ජාතික මට්ටමේ සමුපකාර සංගම් 12ක් වර්ෂය තුළ ක්‍රියාකාරි තත්ත්වයේ පැවති අතර, දෙපාර්තමේන්තුව විසින් එකී සංගම්හි කළමනාකරණ හා ව්‍යාපාරික කටයුතු සඳහා මගපෙන්වමින් හා ඒ සඳහා සානුබල සපයමින් ඒවායේ ක්‍රියාකාරිත්වය පිළිබඳව සෘජු අධීක්ෂණයක් ලබා දෙන ලදී.

### 03. 1 වර්ෂය තුළ ක්‍රියාත්මක වූ සමුපකාර සංගම්

| | සංගමයේ නම | ලියාපදිංචි අංකය | ලියාපදිංචි දිනය |
|---|---|---|---|
| 01 | සී/ස ශ්‍රී ලංකා පොල් නිපදවන්නන්ගේ සමුපකාර සමිති සංගමය | සී 1086 | 1942.04.01 |
| 02 | සී/ස ශ්‍රී ලංකා ජාතික ධීවර සමුපකාර සමිති මහා සංගමය | සී 1227 | 1952.02.02 |
| 03 | සී/ස ශ්‍රී ලංකා ජාතික සමුපකාර මණ්ඩලය | සී 2490 | 1972.07.26 |
| 04 | සී/ස ශ්‍රී ලංකා සමුපකාර අලෙවි සංගමය | සී 2504 | 1973.03.01 |
| 05 | සී/ස ශ්‍රී ලංකා සමුපකාර කර්මාන්ත මහා සංගමය | සී 2527 | 1974.03.19 |
| 06 | සී/ස ශ්‍රී ලංකා සකසුරුවම් හා ණය ගණුදෙනු පිළිබඳ සමුපකාර සමිති මහා සංගමය | සී 2651 | 1980.11.10 |
| 07 | සී/ස ශ්‍රී ලංකා සමුපකාර පේෂ කර්මාන්ත සංගමය | සී 2559 | 1981.09.02 |
| 08 | සී/ස ශ්‍රී ලංකා තරුණසේවා සමුපකාර සමිති සංගමය | සී 2689 | 1986.01.01 |
| 09 | සී/ස ශ්‍රී ලංකා පාරිභෝගික සමුපකාර සමිති සංගමය | සමු 01 | 1989.09.15 |
| 10 | සී/ස ශ්‍රී ලංකා සමුපකාර ග්‍රාමීය බැංකු මහා සංගමය | සමු 17 | 1997.12.15 |
| 11 | සී/ස ශ්‍රී ලංකා සකසුරුවම් හා ණය ගණුදෙනු සමිති සම්පත් කළමනාකරණ සමුපකාර සන්ධානය | සමු 30 | 2005.11.21 |
| 12 | සී/ස ශ්‍රී ලංකා ආරෝග්‍යශාලා සේවා සමුපකාර සමිති මහා සංගමය | සමු 33 | 2007.02.23 |

## 03. 2 වර්ෂය තුළ ක්‍රියාත්මක වූ සමුපකාර සමිති

දෙපාර්තමේන්තුවේ අධීක්ෂණයට හා මෙහෙයවීමට යටත්ව දීප ව්‍යාප්ත ප්‍රාථමික සමුපකාර සමිති 39ක් 2014 වර්ෂය තුළ ක්‍රියාත්මක විය. මෙම සමුපකාර සමිති ප්‍රධාන කාණ්ඩ 02කට වර්ග කර දැක්විය හැකිය.

- දීප ව්‍යාප්ත මූල්‍ය සේවා සමුපකාර සමිති
- දීප ව්‍යාප්ත නිෂ්පාදන හා සේවා සමුපකාර සමිති

## 03. 2.1 දීප ව්‍යාප්ත මූල්‍ය සේවා සමුපකාර සමිති

බහුතරයක් රාජ්‍ය හා පෞද්ගලික ආයතන වල සේවකයින් සාමාජිකත්වය දරන සකසුරුවම්කම හා ණය ගණුදෙනු පිළිබඳ සමුපකාර සමිති වේ.

මෙම සමුපකාර සමිතිවල මූලික කාර්යයන්

❖ සමාජික ඉතුරුම් රාශිකරණය
❖ සාමාජිකත්වයට ණය පහසුකම් සැපයීම
❖ සාමාජික සුභ සාධන කටයුතු (මරණාධාර, ශිෂ්‍යත්ව ආධාර, වෛද්‍යාධාර, පාරිභෝගික සේවා සැපයීම)
❖ ව්‍යාපාරික කටයුතු (විශ්‍රාම ශාලා, නිවාඩු නිකේතන, උකස් සේවා, මුද්‍රණාල සේවා, රක්ෂණ නියෝජිත සේවා)

# දීප ව්‍යාප්ත ආයතනික මූල්‍ය සේවා සමුපකාර සමිති - 2014

| | සමිතියේ නම | ලි. ප. අංකය | ලි. ප. දිනය |
|---|---|---|---|
| 01 | සී/ස බන්ධනාගාර දෙපාර්තමේන්තුවේ අන්‍යෝන්‍ය අර්ථසාධක අරමුදල් සමුපකාර සමිතිය | සී 473 | 1928.03.15 |
| 02 | සී/ස තැපැල් හා ටෙලිකොම් සේවක සමුපකාර බැංකු සමිතිය | සී 503 | 1928.12.07 |
| 03 | සී/ස අධ්‍යාපන සේවා නියුක්තිකයන්ගේ සමුපකාර සකසුරුවම් සහ ණය දෙන සමිතිය | සී 736 | 1930.11.01 |
| 04 | සී/ස ශ්‍රී ලංකාවේ සෞඛ්‍ය කාර්ය මණ්ඩල සංවර්ධන සේවා ස.ණ.ස | සී 744 | 1930.11.10 |
| 05 | සී/ස සෞඛ්‍ය දෙපාර්තමේන්තුවේ සමුපකාර සකසුරුවම්කම සහ ණය ගනුදෙණු පිළිබඳ සමිතිය | සී 290 | 1938.03.30 |
| 06 | සී/ස ශ්‍රී ලංකා මහජන සෞඛ්‍ය පරීක්ෂකවරුන්ගේ සකසුරුවම්කම සහ ණය ගනුදෙණු සහ සුභසාධක සමුපකාර සමිතිය | සී 303 | 1938.04.28 |
| 07 | සී/ස රෙජිස්ට්‍රාර් ජනරාල් දෙපාර්තමේන්තුවේ සේවකයින්ගේ සකසුරුවම් සහ ණය ගනුදෙණු පිළිබඳ සමුපකාර සමිතිය | සී 255 | 1939.10.20 |
| 08 | සී/ස ශ්‍රී ලංකා වරාය අධිකාරියේ සේවකයින්ගේ සුභ සාධක සමුපකාර සමිතිය | 1046 | 1943.11.23 |
| 09 | සී/ස දුම්රිය ස්ථානාධිපතිවරුන්ගේ සහ ලිපිකරුවන්ගේ සමුපකාර සකසුරුවම් ඉතිරි කිරීමේ හා ණය දෙන සමිතිය | සී 1649 | 1949.03.29 |
| 10 | සී/ස දුම්රිය මාර්ග හා වැඩ දෙපාර්තමේන්තුවේ සකසුරුවම් හා ඉතිරිකිරීමේ සමුපකාර සමිතිය | සී 1707 | 1950.08.30 |
| 11 | සී/ස සෞඛ්‍ය සේවා මුදල් ඉතිරි කිරීමේ සහ ණය ගනුදෙණු පිළිබඳ සමුපකාර සමිතිය | සී 2233 | 1959.11.19 |
| 12 | සී/ස ලංගම සේවක සකසුරුවම් හා සුභසාධක සමුපකාර සමිතිය | කේ.ඊ. 299 | 1960.05.26 |
| 13 | සී/ස මහජන බැංකු සේවක සමුපකාර සමිතිය | සී 2266 | 1962.02.10 |
| 14 | සී/ස රාජ්‍ය සේවා සමුපකාර ණය දීමේ හා ඉතිරි කිරීමේ සමිතිය | සී 326 | 1962.02.10 |
| 15 | සී/ස සතොස සේවකයින්ගේ සමුපකාර සකසුරුවම් සුභසාධක සහ ණය දෙණ සමිතිය | සී 2294 | 1963.01.26 |
| 16 | සමුපකාර දෙපාර්තමේන්තු මාණ්ඩලික නිලධාරි සකසුරුවම් හා ණය ගනුදෙණු පිළිබඳ සමුපකාර සමිතිය | සී 2357 | 1962.10.26 |
| 17 | සී/ස බ්‍රවුන් හවුලේ කාර්මික හා පොදු සේවා සකසුරුවම් සහ ණය ගනුදෙණු පිළිබඳ සමුපකාර සමිතිය | සී 2383 | 1967.10.01 |
| 18 | සී/ස ශ්‍රී ලංකා රාජ්‍ය ඉංජිනේරු සංස්ථායීය සකසුරුවම්කම හා ණය ගනුදෙණු පිළිබඳ සමුපකාර සමිතිය | සී 2402 | 1968.08.29 |
| 19 | සී/ස දේශීය ආදායම් දෙපාර්තමේන්තුවේ ඉතිරි කිරීමේ සමුපකාර සමිතිය | සී 931 | 1973.07.25 |
| 20 | සී/ස ශ්‍රී ලංකා වරාය අධිකාරියේ සේවක සමුපකාර බැංකු සමිතිය | සමු 02 | 1989.12.20 |
| 21 | සී/ස මැනුම් දෙපාර්තමේන්තුවේ මැනුම් සහයකරුවන්ගේ සකසුරුවම් හා ණය ගනුදෙණු පිළිබඳ සුභසාධක සමුපකාර සමිතිය | සමු 10 | 1994.02.09 |
| 22 | සී/ස ශ්‍රී ලංකාවේ කාන්තාවන්ගේ සංවර්ධන සේවා සමුපකාර සමිතිය | සමු 18 | 1998.04.06 |
| 23 | සී/ස සණස සංවර්ධන බැංකුවේ සේවක සණස සමිතිය | සමු 22 | 2000.06.26 |
| 24 | සී/ස සමෘද්ධි සංවර්ධන හා කෘෂිකර්ම පර්යේෂණ සහකාර නිලධාරින්ගේ සකසුරුවම් හා ණය ගනුදෙණු පිළිබඳ සමුපකාර සමිතිය | සමු 25 | 2001.05.05 |

| | | | |
|---|---|---|---|
| 25 | සී/ස ජල සම්පාදන මණ්ඩලයේ සමස්ත සේවකයින්ගේ සකසුරුවම් හා ණය ගනුදෙණු පිළිබඳ සමුපකාර සමිතිය | සමු 31 | 2006.01.03 |
| 26 | සී/ස රාජ්‍ය සේවා උපාධිධාරි සකසුරුවම් හා ණය ගනුදෙණු පිළිබඳ සමුපකාර සමිතිය | සමු 32 | 2006.11.29 |
| 28 | සී/ස ප්‍රජාශක්ති තරුණ අභිවෘධි සමුපකාර සමිතිය | සමු 43 | 2014.10.02 |
| 27 | සී/ස ශ්‍රී ලංකා රාජ්‍ය කළමනාකරණ සහකාර සේවා නිලධාරීන්ගේ ඉතිරි කිරීමේ හා සංවර්ධන සේවා සමුපකාර සමිතිය | සමු 44 | 2014.08.12 |

## 03. 2.2 දීපව්‍යාප්ත නිෂ්පාදන හා සේවා සමුපකාර සමිති

මෙම දෙපාර්තමේන්තුව යටතේ ලියාපදිංචි ශ්‍රී ලංකාවම බල ප්‍රදේශය කර ගත් සාමාජිකයන්ගේ අවශ්‍යතා හා වුවමනා සපුරාලීම සඳහා භාණ්ඩ නිෂ්පාදන කාර්යයේ නියුතු සමුපකාර සමිති හා විවිධ සේවාවන් සැපයීමේ කාර්යයේ නියුතු සමුපකාර සමිති, දීපව්‍යාප්ත නිෂ්පාදන හා සේවා සමුපකාර සමිති ලෙස වර්ගීකරණය කර ඇත.

මෙම සමිති වල මූලික කාර්යයන්

- ❖ සාමාජිකයන්ගේ නිෂ්පාදන මිලදී ගැනීම
- ❖ නිෂ්පාදන හා සේවා සැපයීම සඳහා සාමාජිකයින්ට අවශ්‍ය අමුද්‍රව්‍ය ලබාදීම
- ❖ සාමාජිකයින්ගේ නිෂ්පාදන සඳහා වෙළඳපොල හඳුන්වාදීම සහ වෙළඳපොල අවස්ථා පුළුල් කිරීම
- ❖ සාමාජිකයින් සඳහා තාක්ෂණික මෙවලම් හා නවීන තාක්ෂණය හඳුන්වාදීම

| | සමිතියේ නම | ලි. ප. අංකය | ලි. ප. දිනය |
|---|---|---|---|
| 01 | සී/ස මුද්‍රණ ශිල්පීන්ගේ සමුපකාර සමිතිය | සී 2280 | 1962.08.10 |
| 02 | සී/ස සමස්ත ලංකා විචිත්‍ර පැළැටි හා උඩවැඩියා සමුපකාර සමිතිය | සී 2409 | 1969.11.28 |
| 03 | සී/ස සමස්ත ලංකා අභ්‍යාස පොත් නිපදවන්නන්ගේ සමුපකාර සමිතිය | සමු 03 | 1990.03.07 |
| 04 | ශ්‍රී ලංකා මාදැල් හිමියන්ගේ සමුපකාර සමිතිය | සමු 07 | 1992.01.29 |
| 05 | සී/ස වතු සේවා නිලධාරීන්ගේ නිවාස සමුපකාර සමිතිය | සමු 28 | 2003.07.11 |
| 06 | සී/ස සමස්ත ලංකා සුළු හා මධ්‍යම පරිමාණ ධාන්‍ය සැකසුම්කරුවන්ගේ ව්‍යාවසායකත්ව සංවර්ධන සමුපකාර සමිතිය | සමු 34 | 2007.03.07 |
| 07 | සී/ස සමස්ත ලංකා කෘෂි කාර්මික සමුපකාර සමිතිය | සමු 41 | 2010.01.05 |
| 08 | සී/ස ශ්‍රී ලංකා වරාය නැව් සේවා සමුපකාර සමිති | සමු 36 | 2011.07.07 |
| 09 | සී/ස නිවාස හා දේපළ සමුපකාර සංවර්ධන සමිතිය | සමු 39 | 2011.07.07 |
| 10 | සී/ස රජරට විශ්වවිද්‍යාලීය සමුපකාර සමිතිය | සමු 40 | 2011.08.28 |
| 11 | සී/ස කිරි නිෂ්පාදකයින්ගේ ජාතික සමුපකාර සමිතිය | සමු 45 | 2014.10.02 |